**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #June22**

වයින පුවත්පත මගින් විගණකාධිපතිවරයාව උපුටා දක්වමින්, ඔහු විසින් සඳහන් කළා යැයි පැවසෙනා ප්‍රකාශයක් පසුගිය අඟහරුවාදා (19) පළ කොට තිබිණි. කෙසේ නමුත් එම ප්‍රවෘත්තිය නිවැරදි නොවන බව සඳහන් කරමින් විගණකාධිපතිවරයා දිවයින පුවත්පත වෙත කළ දැනුම්දීමකට පසුව, සිකුරාදා (22) එනම් අද දින "'දිවයින' පුවත ගැන විගණකාධිපති කරුණු පහදයි" යන මැයෙන් තවත් ලුහුඬු පුවතක් දිවයින මගින් පළ කොට ඇත.

මින් පෙරද අප පවසා ඇති ආකාරයට නිවැරදි නොවන පුවතක් සම්බන්ධයෙන් යම් ආකාරයක හෝ කරුණු පැහැදිලි කිරීමක් සිදුකිරීම ප්‍රශංසනීය වේ. කෙසේ නමුත් මෙය සැබවින්ම ප්‍රමාණවත් නිවැරදි කිරීමක් වන්නේද? ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට කණගාටුව ප්‍රකාශ කිරීමක් හෝ දක්නට නොමැත්තේ මන්ද?

ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ පහත ලෙසින් සඳහන් වන බවද අවසානයට පෙන්වා දෙමු.

3.1 වාර්තාවක් කරුණු අතින් වැරැදි යැයි කර්තෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් හා යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක්ද ඇතිව, එම නිවැරදි කිරීම හා සමා අයැදීම පීඩිත පාර්ශවයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම නිවැරැදි කළ යුත්තේය.